# කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

# තේ පර්යේෂණ මණ්ඩලය

## කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)

තලවකැලේ, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ පවත්නා පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)**

**රැකියා විස්තරය :**

ආයතනයේ කළමනාකරණ කාර්ය සඳහා පහසුකම් සැපයීම, සහයවීම හා අතිරේකණ කටයුතුවල තාක්ෂණ නොවන ස්වභාවයේ ක්‍රියාකාරකම් සිදුකරලීමේ වගකීම දරයි.

**බාහිර :**

අ.පො.ස. (සා/පෙළ) විභාගය, එක් වරකදී, භාෂාව (සිංහල / දෙමළ) හා ගණිතය ඇතුළත්ව සම්මාන හතරක් සහිතව විෂයයන් හයකින් (06) සමත්ව සිටීම.

සහ

අ.පො.ස. (උ/පෙළ) විභාගය විෂයයන් තුනකින් (පොදු ප්‍රශ්නපත්‍රය හැර) සමත්ව සිටීම.

සටහන : සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයෙන් පරිගණක යෙදවුම් (e.g. word processing, spread sheet) පිළිබඳ දැනුම ලබා තිබීම විශේෂිතව වාසිදායක වේ.

**අභ්‍යන්තර :**

පහත සඳහන් සුදුසුකම් සහිතව, ප්‍රාථමික තලයේ පුහුණු, අර්ධ පුහුණු හා නුපුහුණු වර්ගීකරණයේ සේවකයන් අයදුම්කිරීමට සුදුසුකම්ලබති.

**අධ්‍යාපනික :**

අ.පො.ස. (සා/පෙළ) විභාගය භාෂාව (සිංහල / දෙමළ) හා ගණිතය ඇතුළත්ව සම්මාන හතරක් (04) සහිතව විෂයයන් හයකින් (06) සමත්ව සිටිය යුතුය.

**වෙනත් :**

ඉහත සේවක වර්ගීකරණය යටතේ ස්ථිර තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**සටහන :**

ස්ථිර තනතුරකට පත්කිරීමට පූර්වයෙන් ඉටුකළ යම් සේවා කාලයක් හෝ ස්ථිර පදනමින් තනතුරකට පත් කිරීම සඳහා පූර්වාවශ්‍යතාවයක් ලෙස පුහුණුවීම් කාලයක් යටතේ සම්පූර්ණ කළ සේවා කාලයක්, ඉහත සඳහන් සුදුසුකම් සඳහා අවශ්‍ය පස් අවුරුදු කාලය සඳහා ගණන් ගනු නොලැබේ. එසේම, අනියම් / තාවකාලික පදනමින් අදාළ වන යම් සේවා කාලයද මෙම කාර්ය සඳහා අදාළ නොවේ.

**වැටුප් පරිමාණය :**

MA 1-2 (2016) රුපියල් 27,910-10X300 - 7X350 - 12X600 - 12X710 - 49,080/- (මාසිකව)

**වයස :**

අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :**

ලිඛිත තරග විභාගයක් සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වෙනත් ප්‍රතිලාභ :**

i) පවත්නේ නම් නවාතැන් (පූර්ණ ගෘහ භාණ්ඩ සහිත නිල නිවාස) පහසුකම් හෝ ඒ වෙනුවට යම් ගෙවීමක් ලබා දෙනු ඇත.

ii) ආයතනයේ දැනට පවත්නා නියමයන් ප්‍රකාරව වන වෛද්‍ය යෝජනා ක්‍රමය මගින් වෛද්‍ය ප්‍රතිලාභ ලබා දෙනු ඇත.

iii) **අර්ථ සාධක අරමුදල** : තෝරාගත් අයදුම්කරු විසින්, තම මාසික වැටුපෙන් 10% ප්‍රමාණයකින් කාර්ය මණ්ඩල අර්ථසාධක අරමුදල සඳහා දායක විය යුතු අතර, ආයතනය විසින් ඒ සඳහා 15% දායකත්වයක් දරනු ඇත. එයට අමතරව, ආයතනය විසින් 3% දායකත්වයක් සේවක භාර අරමුදලටද ලබාදෙනු ඇත.

iv) තේ පර්යේෂණ ආයතනයේ තනතුරට අදාළවන අනෙකුත් ආයතනික ප්‍රතිලාභද හිමිය.

මෙම තනතුර ස්ථිර එකකි. **සම්පූර්ණ ජීවදත්ත** ඇතුළත්ව උප්පැන්න සහතිකය, අනෙකුත් අදාළ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහතික, සේවා සහතිකවල පිටපත්, නවෝත්පාදක කුසලතා සම්බන්ධ වෙන්න සාක්ෂි සමග, අදාළ ක්ෂේත්‍රයේ අයදුම්කරුගේ කුසලතා හා දැනුම තක්සේරුකර බැලීම සඳහා ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිතව සකස් කළ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

රාජ්‍ය සේවයේ / සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුය. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවන අයුරින් ඉදිරිපත් කෙරෙන අයදුම්පත් ප්‍රතික්ෂේප වීමට අවකාශ ඇත.

කරුණාකර, තේ පර්යේෂණ ආයතනයේ වෙබ් අඩවිය වන www.tri.lk වෙත ප්‍රවිෂ්ටව ගුගල් ආයතනයෙන් ඉල්ලුම් කරන විස්තර උඩුගත කොට පසුවිපරම් කටයුතු සඳහා සම්පූර්ණ කළ අයදුම්පත, සහායක ලේඛන සමග පහත සඳහන් අය වෙත 2024 අප්‍රේල් 16 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. එසේම, අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**ශාන්ත කූම්බ්ස්, තලවකැලේ.**